**ජනතා වතු සංවර්ධන මණ්ඩලය**

**වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය**

**ඇබෑර්තු**

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගන්නා ලද අයදුම්කරුවන් රජය විසින් නිකුත් කරන ලද හා ඉදිරියේදී නිකුත් කිරීමට අපේක්ෂිත අණ පණත් හා ආයතනික නීති රීති, රෙගුලාසි හා ප්‍රතිපත්තිවලට අනුකූලව තනතුරට අදාල කාර්යයන් ඉටුකිරීමට මනා හැකියාවක් ඇති අය විය යුතුය.

**<u>සහකාර වතු අධිකාරී - 02 තනතුරු</u>**

**තනතුරට පැවරෙන කාර්යයන් :-**

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ කර්මාන්තශාලා/ වතු වලට (තේ,රබර්,පොල්) අදාළව අභිමතාර්ථ සහ අරමුණු සාක්සාත් කරගැනීම සඳහා ප්‍රතිපත්ති සැලසුම් කිරීම, නිර්දේශ කිරීම,කර්මාන්තශාලා/ වතු දෛනිකව පවත්වාගෙන යාම උදෙසා අවශ්‍යතා හඳුනාගැනීම, මෙහෙයවීම, අධීක්ෂණය, ඇගයීම හා අදාළ අංශ සම්බන්ධීකරණය කිරීම වතු/ කර්මාන්තශාලා කාර්යය මණ්ඩලයේ කාර්යාල පාදක අවශ්‍යතා හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරීම පිණිස වතු අධිකාරීට සහය වීම.

**සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාවේදී/වැවිලි කළමනාකරණය / කෘෂිකර්මය හෝ නිෂ්පාදන කළමනාකරණ උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. මෙම ආයතනයේ කණිෂ්ඨ කළමනාකාර (JM 1-1) සේවා ගණයෙහි තනතුරක සහකාර වතු අධිකාරීවරයෙකු ලෙස අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

වයස : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය.

සේවා ගණය : " කළමනාකාර"

පත්වීමේ ස්වාභාවය : ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත

වැටුප් පරිමාණය හා වැටුප් කේතය : MM 1-1 රු.(91,690/-10xRs.2,480/-15xRs.3,450/-Rs.168,240/-)

SINCE 2014
Gazette.lk
AMBITIONS REALIZED

වෙනත් :-

සෑම අයදුම්කරුවෙකුම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

රහස්‍ය ලේකම් - 01 තනතුර

තනතුරට පැවරෙන කාර්යයන් :-

ආයතනික නීති රීතිවලට අනුකූලව පිළියෙල කරණු ලබන වාර්තා, ලේඛන ආදිය ඉහළ කළමනාකාරිත්වය වෙත යොමු කිරීම, නිසි පරිදි ආරක්ෂාකාරීව තැන්පත් කර තබා ගැනීම හා අදාළ තොරතුරු වල රහස්‍ය භාවය සුරැකෙන ආකාරයට කටයුතු කිරීම.

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අවසන් පරික්ෂණය සමත්වීම. ( Institute of Charted Corporate Secretaries Sri Lanka / Technical College)

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 )

1. ඉහත සදහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. ' කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන' (MA 1) සේවා ශ්‍රේණියෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

වයස : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

සේවා ගණය : ' කණිෂ්ඨ කළමණාකාර'

පත්වීමේ ස්වාභාවය : ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත

වැටුප් පරිමාණය හා වැටුප් කේතය: JM 1-1 (72,650/-10x Rs.1,360/-18x Rs.2,040/-Rs.122,970/-)

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

වෙනත් :-

සෑම අයදුම්කරුවෙකුම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

තනතුරට අදාල පොදු කොන්දේසි

1. මෙම තනතුර ස්ථිර වන අතර විශ්‍රාම වැටුප් රහිතය.
   සේවක අර්ථසාධක අරමුදලට සේවකයාගෙන් 10% ක් සහ සේව්‍යාගෙන් 12% ක්ද සේවක භාරකාර අරමුදලට සේව්‍යාගෙන් 3% ක්ද දායකත්වය දරනු ලබයි.
2. රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කලයුතු වේ.
3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කෙරේ.
4. අයදුම්කරු පිළිබඳ වාර්තා ලබාගත හැකි ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් අයදුම්පත සමග ඉදිරිපත් කල යුතුය.
5. අධ්‍යාපන, වෙනත් සහතික පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායාපිටපත් අයදුම්පතට අමුණා එවිය යුතු වේ.
6. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට සියළුම සුදුසුකම් සපුරා තිබිය යුතු වේ.

අයදුම්කල යුතු ආකාරය

මේ සමග සුදුසුකම් ඇති අයදුම්කරුවන් අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් පළපුරුද්ද සහ පෞද්ගලික තොරතුරු යනාදිය ඇතුලත් ජීව දත්ත එවන ලියුම්කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කොට පහත සඳහන් ලිපිනයට 2026.09.01 දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අපහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලිපිනය :
ජනතා වතු සංවර්ධන මණ්ඩලය
**55/75,** වොක්ෂෝල් වීදිය
කොළඹ - **02**

විද්‍යුත් තැපැල - **jedbhr2@gmail.com**

SINCE 2014
Gazette.lk
AMBITIONS REALIZED